


# ඔස්කාර් සිනමා උළෙලේ සම්මාන ලාභිනියෝ

අසූ දෙවැනි ඔස්කාර් සම්මාන උළෙල මාර්තු 08 වැනි දින උත්කර්ශවත් අන්දමින් පැවැත්වුණේ ලෝක කාන්තා දිනයේ වටිනාකම වැඩි කරමිනි. ඔස්කාර් සම්මාන උළෙලකදී පළමුවරට අධ්‍යක්ෂණය උදෙසා කාන්තාවකට සම්මානයක් හිමිවීමේ සුවිශේෂී සිදුවීම සැබැවින්ම කාන්තා දිනයට ලැබුණු ත්‍යාගයක් වැනිය. " ද හර්ට් ලොකර්" අධ්‍යක්ෂණය කිරීම උදෙසා කැත්‍රින් බිග්ලෝ මෙම සම්මානය දිනාගත්තාය.


සැන්ඩ්‍රා බුලොක්

## හොඳම නිළිය - සැන්ඩ්‍රා බුලොක්

මවගේ කලා හැකියාව දායාද කරගත් දියණියක් ලෙස සැන්ඩ්‍රා හඳුන්වන්න පුළුවන්, හෙල්ගා බුලොක් නම් ඇයගේ මව ඔපෙරා ගායිකාවක් වගේම හඬ පුහුණු කරන ගුරුවරියක් . 1964 ජූලි 26 වැනි දින ඇමරිකාවේ වර්ජීයාහී උපන් සැන්ඩ්‍රාට සිටින්නේ එක් සොහොයුරියක් පමණයි. ඇය නීතිඥ වරියකි. සැන්ඩ්‍රාට මුලින්ම කලා ලොවට ඒමට මුල පිරුණේ මවගේ ගීතිකා කණ්ඩායම් වලට සහභාගී වීමෙනි. ඇයගේ ගී ගැයීමේ හැකියාව පසු කාලීනව සිනමා ජීවිතයට ද මහත් ආධාරයක් විය.The thing called love (1993) සිනමාපටයේ ගී ගයන ගැමි තරුණියකගේ භූමිකාව නිරූපනය කළාය.සැන්ඩ්‍රාගේ සිනමා ගමනට මුල පිරුණේ ගැටවරවියේදී වොෂින්ටන් නගරයට පැමිණීමට සිදුවීමත් සමගය. ඇය උතුරු කැරොලිනා විශ්ව විද්‍යාලයෙන් රංගනය පිළිබඳ හැදෑරුවාය. පසුව ඇය නිව්යෝර්ක් නගරයේ වේදිකා රංගනයට යොමුවුණු අතර, රූපවාහිනී නිළියක හා සිනමා නිළියක වීමේ මාවත විවෘත වූයේ එතැනදීයි.

Demolition Man (1993) සහ Wrestling Ernest Hemingnas (1993) වැනි සිනමා පටවල ඇය ප්‍රේක්ෂකයන්ගේ මතකයෙන් බැහැර නොවන අන්දමේ චරිත නිරූපනය කළාය. එහෙත් සැන්ඩ්‍රා බුලොක් නම් නවක නිළිය දෙස කාගේත් ඇස් යොමුවූයේ 1994 වසරේ දී ඇය රගපෑ " ස්පීඩ්" ඇය හොලිවුඩයේ ජනප්‍රියම නිළියක් බවට පත්වීමේ වාසනාව ගෙනාවේය. සැන්ඩ්‍රා 2005 වසරේ ජෙස් ජේම්ස් ද ? සමග විවාහ වූවාය. සිනමාවේ සදාතනික දක්ෂයින් සිය දෙනා අතරත් පියකරුම නිළියන් සියය අතරත් ඇයගේ නම ඇත.මෙවර ඔස්කාර් සම්මාන උළෙලේදී සැන්ඩ්‍රාගේ නම, හොඳම නිළිය ලෙස සිනමා පට දෙකකටම නිර්දේශ විය. All About Steve හා The Blind Side එම සිනමා පට දෙකයි.

The Blind Side රංගනයට සැන්ඩ්‍රා බුලොක් හොඳම නිළිය ලෙස ඔස්කාර් සම්මානය දිනා ගත්තාය. The Blind Side සිනමා පටය පිළිබඳ වෙළඳ ප්‍රචාරයන් ලබා දීමේදී උපයෝගී කරගෙන ඇත්තේ සැන්ඩ්‍රාගේ නම පමණි. නිළියකගේ නම පමණක් මූලික කරගෙන වෙළඳ ප්‍රචාරයක් ලබා දුන් අවස්ථා බොලිවුඩයේ විරලය. සැන්ඩ්‍රා ගේ තරු බලය එයින්ම කියා පානවා නොවේද.......

## හොඳම සහාය නිළිය මො' නික් (MO' NIQUE)

1967 දෙසැම්බර් 11 වැනි දින උපන් මො' නික් වඩා ප්‍රචලිත විකට නිළියක ලෙසයි. ඇය ප්‍රීසියස් සිනමා රංගනය සඳහා හොඳම සහාය නිළියට හිමි සම්මානය දිනාගත්තේ එසේ සම්මාන දිනූ පළමු කළුජාතික කාන්තාව බවට පත්වෙමිනි.මො' නික් තිදරු මවකි. පළමු විවාහයෙන් ඇයට එක් දරුවකු සිටින අතර, දෙවැනි විවාහයෙන් ඇයට සිටින්නේ නිවුන් පිරිමි දරුවන්ය.



අන්තර් ජාලයෙනි.
සටහන:-
**චම්පිකා දීපානි රණසිංහ**